2014.01.16

ප්‍රවෘත්ති කර්තෘ/ සංස්කාරක,

**බස්නාහිර, දකුණු පළාත් සභා මැතිවරණ සඳහා තරඟ වදින සියළුම අපේක්ෂකයන් හා පක්ෂ නායකයින්ගෙන් කෙරෙන ඉල්ලීමයි.**

බස්නාහිර, දකුණු පළාත් සභා මැතිවරණය සඳහා මේ වන විට නාම යෝජනා භාරගැනීමට දින නියම කර ඇති අතර, දැනටමත් ප්‍රධාන ධාරාවේ බොහෝ පක්ෂවල අපේක්ෂකත්වය අපේක්ෂා කරන පිරිස් ප්‍රචාරක කටයුතු ආරම්භ කර ඇත. එමෙන්ම බොහෝ පක්ෂ මේ වන විට  නාම යෝජනා ලැයිස්තු සකස් කරමින් සිටී. එබැවින් අප මෙවර මැතිවරණයට තරඟ වැදීමට නියමිත සියළු අපේක්ෂකයන්ගෙන් ඉතා ඕනෑකමින් ඉල්ලා සිටින්නේ ඔබගේ නාම යෝජනා පත්‍ර සමගම ඔබගේ වත්කම් බැරකම් ප්‍රකාශ දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරියා වෙත බාරදෙන ලෙසත්, හැකිනම් එය ජනතාවට විවෘත කරන ලෙසත් ය. එ මගින් ඔබගේ අවංක භාවය, ඔබගේ පාරදෘශ්‍ය භාවය, ඔබගේ ජන්ද දායකයා ඉදිරියේ සනාථ කරන ලෙසත් ය. ඔබ එසේ කිරීමට සමත් වුවහොත් එය නියත ලෙසම ඔබගේ ජයග්‍රහණයට හේතුවක් වනු ඇත.

එමෙන්ම අප ඔබගෙන් ඉතා ගෞරවයෙන් ඉල්ලා සිටින දෙවන කාරණය වන්නේ ඔබගේ ප්‍රචාරක ව්‍යාපාරය තුළ හුදු සටන්පාඨ වෙනුවට ඔබගේ ප්‍රතිපත්ති සහ ඉදිරි සැළසුම් පිළිබඳ ඔබගේ ජන්ද දායකයාට හෙළිකරන ලෙසයි. මඩ දේශපාලනයෙන් සහ බාල දේශපාලන උපක්‍රම වලින් ඔබ්බට ඔබ ප්‍රතිපත්ති දේශපාලයට අවතීරණ වුවහොත් එය ඔබේ ජයග්‍රහණයට හේතුවක් වනු ඇත. එමෙන්ම එමගින් රටේ දේශපාලන සංස්කෘතියෙහි යහපත් වෙනසක් ඇති කිරීමට හොඳ ආරම්භයක්  ලබාදීමට ද ඔබට හැකිවනු ඇත. එමෙන්ම පළාත් සභා අපේක්ෂකයෙක් වීමට මහජන නියෝජිතයෙකු වීමට, ඔබට ඇති සුදුසුකම් ද ඒ තුළ අන්තර්ගත  කළහොත් එමගින් ඔබගේ ජන්ද දායකයාට ඔබව හඳුනා ගැනීමට පහසුවක් වනු ඇත. එමෙන්ම එයද ඔබේ ජයග්‍රහණයට හේතුවක් වනු ඇත.

දැනටමත් අපේක්ෂකත්වය අපේක්ෂා කරන සමහර පිරිස් ප්‍රචාරක කටයුතු ආරම්භ කර ඇති බැවින් අවසාන වශයෙන් අප ඔබගෙන් ඉල්ලා සිටින්නේ ඔබගේ මැතිවරණ ව්‍යාපාරය පරිසර හිතකාමී, ප්‍රචණ්ඩත්වයෙන් තොර, මනාප පොරයකින් තොර, සහ මැතිවරණ නීති රීති , මැතිවරණ කොමසාරිස්ගේ උපදෙස් හා උපමාන වලට අනුව මෙහෙයවන ලෙසයි. මේ පිළිබඳව දේශපාලන පක්ෂ නායකයන් අවධානය යොමු කර තම පක්ෂයේ අපේක්ෂකයන් උනන්දු කරවීමට ක්‍රියා කරන ලෙස, ඉල්ලා සිටින අතර අපේක්ෂකයෙකු ලෙස ඔබද මේ පිළිබඳව දැඩි අවධානය යොමු කරනු ඇතැයි අපි දැඩිසේ විශ්වාස කරමු.

ස්තුතියි.

මෙයට විශ්වාසී,

රෝහණ හෙට්ටිආරච්චි,

විධායක අධ්‍යක්ෂ.

පිටපත් :- මැතිවරණ කොමසාරිස් තුමා, මැතිවරණ මහලේකම් කාර්යාලය, රාජගිරිය

මේ පිළිබඳ උනන්දුවක් දක්වන සෙසු ආයතන.

Date: January 16, 2014

**A request from the political party leaders and their candidates contesting the western and southern provincial council elections**

The nomination dates for the elections have nowbeen announced. Already prospective candidates have started their propaganda activities. Also, many parties are in the process of preparing their nomination lists for the election. Against this backdrop, we, People's Action for Free and Fair Elections (PAFFREL), earnestly request all the candidates to submit their asset and liability declaration forms along with nomination papers to the respective Returning Officers. It will even be better if you publish it for the knowledge of the general public, as an act that speaks of your honesty and transparency. Your action in this regard will eventually translate into your electoral victory.

Likewise, we request you to put forward your policy documents outlining your future programme of work, instead of confining yourself to mere slogans for election propaganda. For your electoral victory, it is more advisable for you to carry out policy based politics rather than resorting to mudslinging and cheap political strategies. If you do so, it will herald the beginning of a worthy political culture. If you detail out your qualifications along with the submission of such papers, it will be easy for your voters to understand your competence to hold positions in the respective provincial councils. It will be a plus point to gain victory.

In the backdrop of some prospective candidates already joining the fray, we would like to request you all to adopt environmental friendly propaganda methods, and to adhere to instructions and guidelines set by the Elections Commissioner. In this exercise, our other request for you is to desist from any form of violence in the tussle for preferential votes. We believe the political party leaders will encourage their candidates to act accordingly. It is our belief that individual candidates should also give this a serious thought.

Thanking Your

……………………..

Executive Director

Copied to Elections Commissioner and all those concerned.